# තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

## ඒකාබද්ධ රියදුරු සේවය III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීමට ඉල්ලුම්පත් කැඳවීම

1. තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයට අනුමත ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු තුනක් (03) පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.
2. වෘත්තීය පරීක්ෂණයක කුසලතාවය මත මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමට පවත්වන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් පසු සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.
3. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්වය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.
4. වැටුප් ඛණ්ඩය සහ පරිමාණය
   රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය - රු.25,790-10-x270-10x300-10x330-12x350-38,990 - (PL 3- 2016) වේ. රා.ප.ච. 03/2016 හි උපලේඛණ II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ.
5. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධරයන් යටත් විය යුතු වේ. තවද, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට නිලධරයන් දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට නිලධරයන් දායක මුදල් ගෙවිය යුතුය.
6. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03 ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.
7. සුදුසුකම් : රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

   i. අධ්‍යාපන සුදුසුකම් :
   අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම්පත සමඟ අමුණා එවිය යුතුය).

   ii. වෘත්තීය සුදුසුකම් :

   (අ) පෞද්ගලික / කුලී රථ සහ තාර බර ‍හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුන (03) කට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය)

   (ආ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

   iii. පළපුරුද්ද

   වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය)

iv. කායික සුදුසුකම

(අ) අවම උස අඩි 05 ක් විය යුතුය.

(ආ) දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් මඟින් එය සනාථ කළ යුතුය.

v. වෙනත් සුදුසුකම

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඇ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2019.05.10 දිනට හෝ ඊට පෙර හෝ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8. වෘත්තීය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදීම පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රියදුරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සාමාන්‍ය හා වෘත්තීය සම්මුඛ පරීක්ෂණ එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

9. ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.

10. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කවර හේතුවක් නිසා හෝ ක්‍රියා කරනු නොලැබේ.

11. ලැබී ඇති අයදුම් පත්‍ර අතරින් මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත හා 2019.05.10 දින හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් වෘත්තීය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ හා පත්වීම් බලධාරියා ඉල්ලුම් කරන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කරන සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

    I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
    II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

14. ඉල්ලුම් කළ යුතු පිළිවෙල
සියළු විස්තර ඇතුළත් කරමින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත දැක්වෙන ලිපිලේඛණවල පිටපත් සමඟ (මුල් පිටපත් ඉදිරිපත් නොකළ යුතුය) 2019.05.10 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, 6 හා 7 මහල, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, අංක 310, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

    I. උප්පැන්න සහතිකයේ පැහැදිලි ඡායා පිටපතක්
    II. ජාතික හැඳුනුම්පතේ පැහැදිලි ඡායා පිටපතක්
    III. වලංගු රියදුරු බලපත්‍රයේ පැහැදිලි ඡායා පිටපතක්
    IV. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතිකවල ඡායා පිටපත්
    V. සේවා පළපුරුද්ද සම්බන්ධව සහතිකවල ඡායා පිටපත්
    VI. පදිංචිය හා චරිතය පිළිබඳ වලංගු ග්‍රාම නිලධාරී සහතිකය
    VII. මාස 06 ක් තුළ ලබා ගත් චරිත සහතික දෙකක්

15. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "රියදුරු III ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

16. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

17. සම්මුඛ පරීක්ෂණයන්ට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග පරිදි,

.......................................

ලේකම්
තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය
2019 අප්‍රේල් මස 17 දින දීය.

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය
6 හා 7 මහල, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, අංක 310, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10.